ගමනක දී උපවාසයේ නිරත වීම යහපත් කටයුතු අතුරින් නොවන්නකි

ජාබිර් ඉබ්නු අබ්දිල්ලා (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ගමනක නිරත වී සිටියහ. එවිට එතුමාණෝ මිනිසකු වටා එක්රැස් වී සිටින පිරිසක් දුටුහ. ඔහුට හෙවණ ලබා දෙමින් තිබිණ. එවිට එතුමාණෝ "මේ කුමක් ද?" දැයි විමසූහ. ඔවුහු 'ඔහු උපවාසකරුවකු වේ." යැයි පැවසුවෝය. එවිට එතුමාණෝ ගමනක දී උපවාසයේ නිරත වීම යහපත් කටයුතු අතුරින් නොවන්නකි." යැයි පැවසූහ. තවත් ප්රකාශයක: "ඔබට අල්ලාහ් පිරිනමා ඇති සහනයන් පිළිපැඳීම
ඔබ සතු වගකීමකි" යැයි පවසා ඇත්තාහ. [صحيح] [متفق عليه]

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ගමනක නිරත වී සිටියහ. එවිට එතුමාණෝ මිනිසකු දුටුහ. ඔහු වටා මිනිසුන් එක්රැස් වී හිරු රෂ්මියෙන් හෙවණ ලබා දෙමින් සිටියහ. ඔහු අධික තිබහයකින් පසු විය. එවිට එතුමාණෝ ඔහුට කුමක් සිදු වී ඇත්තේ දැයි විමසූහ. ඔවුහු 'ඔහු උපවාසයේ නිරත ව සිටින අයෙකි' යැයි පැවසුවෝය. එවිට එතුමාණෝ 'ගමනක උපවාසයේ නිරත වීම යහපත් කටයුතු අතුරින් නොවන්නකි. ඔබට අල්ලාහ් ලබා දී ඇති අවකාශයන් (සහනයන්) පිළිපැඳීම ඔබ සතු වගකීමකි' යැයි පැවසූහ.

http://sunnah.global/hadeeth/si/show/4503